# ආයුර්වේද ශාස්ත්‍රයේ ආරම්භය සම්බන්ධ සාම්ප්‍රදායික විග්‍රහය පිළිබඳ විමර්ශනයක්

බලදොර ඉන්දජෝති හිමි

The term "Ayurvedha" is formed from "auyh + vedha". It conveys the meaning "knowledge about lifespan, knowledge of expanding the lifespan and promoting the lifespan". This shashthra might be a gift of the hereditary knowledge of Indians and a result of the mental improvements of the people who had spiritual powers. However, it has been difficult to find information about its origin, the era in which it became a developed shashthra...etc. Therefore, those who wish to give "Ayurvedha" a respectable status have attempted to name it a gift from the God. This paper is an investigation on the traditional analysis of the origin of Ayurveda. Various views of Ayurvedic schools of disciplines are also analysed here.

---

© බලදොර ඉන්දජෝති හිමි

සංස්. ජයමල් ද සිල්වා, දිල්ශාන් මනෝජ් රාජපක්ෂ, දුලන්කා ලංසකාර,
දිනේෂ් සඳරුවන්
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, තුන් වැනි කලාපය - 2013/2014
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

ආයුර්වේදයේ ආරම්භය පිළිබඳ හැම ග්‍රන්ථයක ම පාහේ සාම්ප්‍රදායික වූ ද සමාන ලක්‍ෂණ සහිත වූ ද විස්තරයක් දක්වා ඇත. භාරතීය මෙන් ම වෙනත් රටවල ද වෛද්‍ය ක්‍රමවල ආරම්භය දෙවියන්ගෙන් සිදු වූ බව තත් දේශ වාසීහු කල්පනා කරති. ග්‍රීසියේ දේශීය වෛද්‍ය ක්‍රමය හර්බන්, ඇපලෝ ආදි දෙවිවරුන්ගෙන් ද මිසරයේ දේශීය වෛද්‍ය ක්‍රමය තොත්, ඔසිරිස් වැනි දෙවිවරුන්ගෙන් ද මිනිස් ප්‍රජාවට ලැබුණු බව ඔවුහු පිළිගනිති.[1]

සාම්ප්‍රදායික විග්‍රහය අනුව ආයුර්වේදය ආරම්භ වූ අවස්ථාවක් හෝ අවසන් වන අවස්ථාවක් හෝ පෙන්වා දිය නො හැකි ය. සුශ්‍රැත අනුව බ්‍රහ්මන් ලෝක ප්‍රජාව මවන්නට පෙර ආයුර්වේදය සකස් කළේ ය. චරක සංහිතාවේ ප්‍රකාශයකින් දැක්වෙන්නේ ආයුර්වේදය නිත්‍ය හා අනාදි බව යි. මේ ශාස්ත්‍රයේ ඇරැඹුමක් හෝ නැවැතුමක් සෙවිය නො හැකි යනු එහි අදහස යි. මනුෂ්‍ය වර්ගයා ඇති වූ දා සිට නැති වන තුරා ම මේ වෛද්‍ය ශාස්ත්‍රය විද්‍යමාන බව එයින් අදහස් වේ.[2]

චරක සංහිතාවේත් සුශ්‍රැත සංහිතාවේත් සම ව දැක්වෙන අදහසක් ලෙස ආයුර්වේදය අථර්වවේදයෙහි උපවේදයක් ලෙස සැලැකීම පෙන්වා දිය හැකි ය.[3] කාශ්‍යප සංහිතාවෙන් චතුර්වේදයේ ම සම්බන්ධය පිළිගන්නා බව පෙනේ.[4]

බ්‍රහ්මවෛවර්ත පුරාණය අනුව ආයුර්වේදය පංචම වේදය යි.[5] ඍග් වේදයට සබඳතාවක් පෙන්වන්නෝ ඊට කරුණු වශයෙන් සෝමලතා වැනි ඖෂධ පැළෑටි භාවිතය, සූර්ය රශ්මියෙන් හෘද රෝග සුව කිරීම, ජලයෙහි ඇති ඖෂධීය ගුණය සඳහන් කිරීම, අන්ධයන්හට හා බිහිරන්හට පෙනීම හා ඇසීම ලබාදීම, කුෂ්ඨරෝග සුව කිරීම, සිඳුණ බිඳුණ අවයව ශල්‍යකර්මයෙන් සුව කිරීම වැනි කරුණු ඍග් වේදයේ ඇතුළත් වීම නිදසුන් කොට දක්වති. එහෙත් සිරා, ධමනි, නාඩි ආදි ශරීර විද්‍යාවට අයත් අවයව ඒවා සමඟ රෝගවල සම්බන්ධතාව, ශල්‍ය හා ඖෂධීය ප්‍රතිකාර විධි, නොයෙක් ඖෂධ පැළෑටිවලින් රෝග සුව කිරීම වැනි චිකිත්සා සමඟ ඉඳුරා ම සම්බන්ධ කරුණු අථර්වවේදයෙහි පරිච්ඡේද වශයෙන් ඇතුළත් නිසා ආයුර්වේදය එහි උපාංගයක් ලෙස සුශ්‍රැතාදී ආචාර්යවරු සලකති.

ඍග්වේදයෙහි වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ කරුණු වෘත්තාන්ත ස්වරූපයෙන් විනා ඍජු ආයුර්වේදීය කරුණු ලෙස නො පෙනෙයි.[6]

මෙලෙස ආයුර්වේදයේ ක්‍රමික ගමන් මඟ අධ්‍යයනය කිරීමේ දී බ්‍රහ්මන් ආයුර්වේදය ප්‍රදානය කළ බව හැම සම්ප්‍රදායයක ම පිළිගැනෙන අදහසකි. චරක සංහිතාව අනුව බ්‍රහ්මන් ප්‍රජාපතිට දෙසූ ආයුර්වේදය ප්‍රජාපති අශ්විනී කුමාරවරුනට උගන්වයි. පසු ව අශ්විනි කුමාරවරුන්ගෙන් ඉන්ද්‍ර ආයුර්වේද ඥානය ලැබූ අතර ඉන්ද්‍රගෙන් භාරද්වාජ අත්‍රි, වශිෂ්ට, භෘගු ආදි දස ඍෂිවරු ආයුර්වේදය ඉගෙනගත් හ.[7]

සුශ්‍රැත අනුව ස්වයංභූ තෙමේ මුලින් ම ආයුර්වේදය නිපදවී ය.[8] බ්‍රහ්ම ප්‍රජාපතිට ද ප්‍රජාපති අශ්වින් කුමාරවරුනට ද ඔවුන් ඉන්ද්‍රට ද ඉන්ද්‍ර ධන්වන්තරීට ද ආයුර්වේදය ඉගැන්වූ බව සුශ්‍රැත සංහිතාවේ ආයුර්වේදය වේදෝත්පත්ති නම් අධ්‍යායයේ සඳහන් කර තිබේ.[9]

එහි දැක්වෙන තවත් කරුණක් වන්නේ කාශිරාජ දිවෝදාස ධන්වන්තරීගෙන් ඖපධේනව, වෛතරණ ඖරභ, පෞෂ්කලාවත, කරවීර්ය, ගෝපුරරක්ෂිත, සුශ්‍රැත ආදි ඍෂිවරු ආයුර්වේදය පිළිබඳ විචාළ බව යි. මිනිසුන් නොයෙක් රෝග ව්‍යාධිවලට පත් වීම තමනට ඉවසුම් නො දෙන බවත් ඒ නිසා ම සෞඛ්‍යය උදෙසා උවදෙස් දෙන ලෙසත් ඍෂිවරු ධන්වන්තරී ඍෂිවරයාගෙන් අයදිති. ඒ අයැදීමෙන් සන්තුෂ්ටි ප්‍රාප්ත ධන්වන්තරී ආයුර්වේදය පිළිබඳ හැඳින්වීමක් කර ශල්‍ය ශාලාක්‍ය, කාය චිකිත්සා, භූත විද්‍යා, කෞමාරභෘත්‍ය, අගදතන්ත්‍ර, රසායනතන්ත්‍ර හා වාජීකරණතන්ත්‍ර යනුවෙන් කොටස් අටක් ආයුර්වේදයෙහි විද්‍යමාන බැවින් කුමක් හැදෑරීමට කැමති දැ යි විමසූ විට ශල්‍යතන්ත්‍රය යැ යි පිළිතුරු ලැබුණෙන් ධන්වන්තරී ඍෂිවරුනට ඒ පිළිබඳ උවදෙස් ලබා දෙයි.

එහි දී ධන්වන්තරී ආයුර්වේදාවතරණය පිළිබඳ ව දක්වමින් ආයුර්වේදය බ්‍රහ්මගෙන් ඇරැඹුණු බවත් ඔහුගෙන් දක්‍ෂ ප්‍රජාපතී ද ඔහුගෙන් අශ්විනි කුමාරවරු ද ඔවුන්ගෙන් ඉන්ද්‍ර ද ඉන්ද්‍රගෙන් තමා (ධන්වන්තරී) ද හදාළ බව පවසයි. ඒ අනුව ශල්‍ය ප්‍රධාන ආයුර්වේදය පිළිබඳ උවදෙස් දීම සඳහා ම ඔහු ලොවට පැමිණි බවත් දක්වයි. ඒ බව සුශ්‍රැත සංහිතාවේ දැක්වේ. මේ අනුව චරකසංහිතාවේ

ආයුර්වේදාවතරණයට වඩා සුශ්‍රැතයේ වෙනසක් පෙනේ. එනම් භාරද්වාජ ආත්‍රේයගේ ස්ථානයේ ධන්වන්තරී සිටීම යි.

කාශ්‍යප සංහිතාවේ විමාන ස්ථානයෙන් ද ආයුර්වේදාවතරණය පිළිබඳ විවරණයක් දැකගත හැකි ය. ඒ අනුව බ්‍රහ්ම ආයුර්වේදය රචනා කර තිබේ. ඒ මිනිසුන් මවන්නටත් පූර්වයෙනි. ඒ මිනිසුනට ඇති විය හැකි රෝගාබාධ ආදියෙන් මිදවීම සඳහා යි. සත්ව මිනිස් ප්‍රජාව මවාලූයේ ඉන් පසු ව ය. බ්‍රහ්ම අශ්විනි කුමාරවරුනට ඉගැන්වී ය. ඔවුන්ගෙන් ඉන්ද්‍රට ද ඉන්ද්‍රගෙන් මනුලොව ඍෂිවරුනට ලැබුණ බව දැක්වේ. කාශ්‍යප, වශිෂ්ඨ, අත්‍රී, භෘගු ආදිහු ඒ අතර වෙති.[10]

මානවයා ආයුර්වේද අධ්‍යයනයට යොමු වීම පිළිබඳ හැම සම්ප්‍රදායයක ම පිළිගැනීම එක් බඳු ම නො වුව ද එක මඟකින් භින්න ව කළ ප්‍රකාශන සේ සැලැකීමට හැකි තොරතුරු හමු වේ. එනම් මානවයා යම් කලෙක පත් වූ අපහසුතාවකට පිළිතුරු සෙවීම් වශයෙන් ආයුර්වේදය පිළිබඳ විමංසනයකට යොමු වුණ බව යි. අධ්‍යාත්ම පර්යේෂණයක නියැළී සිටි ඍෂිවරුනට තත් කාර්‍ය්‍ය සාධනය සඳහා මානසික ඒකාග්‍රතාවක් පවත්වාගැනීමට නො හැකි තත්ත්වයක් උදා විය. ඒ මානව ප්‍රජාව යම් යම් රෝගී තත්ත්වවලට මුහුණ පෑම නිසා යි. ඒ පිළිබඳ බොහෝ වෛද්‍ය ග්‍රන්ථවල දැක්වෙන අදහස මෙසේ ය. කෘත යුගයේ සත්ත්ව ගුණයේ ප්‍රබලත්වය නිසා මිනිසා නිරෝග විය. කෘත යුගයේ පෘථිවි, ජල, වායු, තේජස්, දේශ, කාල, ඖෂධ හා ධන ධාන්‍ය ආදිය සමෘද්ධියෙන් අග්‍රස්ථානයක විය. මිනිසාගේ චින්තන චර්යාව සාධු සම්මත විය. එසේ නමුත් යුගාවසානයෙහි සත්ත්ව ගුණයේ හායනය නිසා එකී මානසික තත්ත්වය ද පරිහානිකර ස්වභාවවලට භාජන විය. රජස් හා තමස් අධික විය. මිනිසා අලස විය. ක්‍රියාශීලිත්වය ගිලිහී යන්නට විය. පෘථිවි ජල වායු ආදියේ ද නොයෙක් වෙනස්කම් ඇති විය. රාග, ද්වේශ, මෝහ ආදිය වර්ධනය විය. මිනිසා ධර්ම මාර්ගයෙන් බැහැර වන්නට විය. ඒ හේතුවෙන් නොයෙක් උපද්‍රව ප්‍රභවය විය. එනම් මානසික අධර්ම චර්යා නිසා මානසික ව්‍යාධි ද මානසික හා කායික අධර්ම චර්යා මෙන් ම බාහිර උපද්‍රව නිසා කායික ව්‍යාධි ද වර්ධනය විය. මේ නිසා සාධූන්ගේ ප්‍රවෘතවලට බාධා විය. තපසට බාධා විය.

සත්‍ය ප්‍රකාශනය ගිලිහිණි. මානසික නිවීම දුරස්ථ විය. ආයුෂය ද පිරිහෙන්නට විය. මෙවැනි තත්ත්වයක් හේතුවෙන් මහාර්ෂීනට තවුස් දම්හි යොමු වී සිත එකඟ කරගැනීමට නො හැකි විය. පොදු මානවයා අසරණ වන විට ඍෂි චින්තනය ද ව්‍යාකූල විය. ලෝක සත්ත්වයා මෙසේ දුකට පත් වීමෙන් උග්‍ර තපස් ඇති කාරුණික ඍෂිවරු ඉමහත් සංවේගයට පත් වූ හ. ඔවුන් ඒ දුක්වලින් නිදහස් කරගැනීම පිණිස කළ යුත්ත කුමක් දැ යි කල්පනයෙහි යෙදුණා හ.[11]

මේ පිළිබඳ සාකච්ඡා කිරීමට මාහාර්ෂීවරුන්ගේ සන්නිපාතයෙක් විය. වෛද්‍ය ග්‍රන්ථ සාහිත්‍යයෙහි ඒ පිළිබඳ දැක්වෙන්නේ හිමාලය පර්වත ප්‍රාන්තයෙහි සිත්කලු භූමියක ඍෂි සම්මේලනය වූ බව යි. ඒ සඳහා දඹදිවින් මෙන් ම නොයෙක් දේශවලින් ද අංගීරා, ජමදග්නි, වශිෂ්ඨ, කාශ්‍යප, භෘගු, ආත්‍රේය, ගෞතම, සාංඛ්‍ය පුලස්ත්‍ය, නාරද, අසිත, අගස්ත්‍ය, වාමදේව මාර්ඛණ්ඩේය, අශ්වලායන, පරික්ෂි, භික්ෂුරාත්‍රේය, භාරද්වාජ කපිඤ්ජල, විශ්වාමිත්‍ර, අශ්මරථ, භාර්ගව, ච්‍යවන, අභිජිත්, ගාර්ග්‍ය, ශාණ්ඩිල්‍ය, කෞණ්ඩින්‍ය, වර්ක්ෂි, දේවල, ශා(ගා)ලව, සංකෘත්‍ය වෛජවාපි, කුශික, බාදරායණ, බඩිශ, ශරලෝම, කාප්‍ය, කාත්‍යායන, කාඞ්කායන, කෛකශේය, ධෞම්‍ය, මරීචි, කාශ්‍යප, ශර්කරාක්‍ෂ, හිරණ්‍යාක්‍ෂ, ලෝකාක්‍ෂ, පෛංගි, ශෞනක, ශාකුණේය, මෛත්‍රේය, මෛත්‍රායනි, වෛඛානස, වාලඛිල්‍ය හා තවත් නොයෙක් තුන් කල් දක්නා වූ නුවණැති බ්‍රහ්මර්ෂිවරුන් ද සාමාන්‍ය ඍෂිවරුන් ද සහභාගි වූ බව දැක්වේ.[12]

ඉහත තොරතුරුවලට තරමක් වෙනස් ප්‍රවෘත්තියක් චරක සංහිතාවේ ම වීම ගැටලු සහගත බවක් මතු කරයි. චරකසංහිතාවේ චිකිත්සාස්ථානයේ ප්‍රථම අධ්‍යායේ රසායන චතුර්ථ පාදය "ආයුර්වේදසමුත්ථානීය" රසායනපාද යනුවෙන් හඳුන්වා තිබේ. ඒ අනුව එහි දී ආයුර්වේදයේ උපත පිළිබඳ සඳහනක් ද කර තිබේ. එයට අනුව පුරාතන මහාර්ෂීවරු ශාලීන (උතුම් ගෘහවල වෙසෙන) හා යායාවර (සියලු තැන්වල ඇවිදින) පිරිසක් වූ හ. පොදු මිනිස් වාස භූමි ආශ්‍රයෙන් කල් ගෙවූ ඔවුනට සිය ඍෂිචර්යා සාර්ථක

කරගන්නට නො හැකි විය. ඒ නිසා ම වතාවත් මග හැරිණි. සෞඛ්‍ය සම්පන්න නො විණි. මේ සියල්ල නාගරික ජීවිතය ඇසුරු කිරීම නිසා බව සිතූ ඔවුහු වනගත වන්නට කල්පනා කළ හ. ඒ අනුව ඔවුන්ගේ තීරණය වූයේ හිමාලය පර්වතය ඇසුරෙහි ජීවත් වීම යි. නාගරික ජීවිතයේ දී ආහාරවලින් හා ඖෂධවලින් ගිලන් වූ අංගීරස්, අත්‍රි, වශිෂ්ඨ, කාශ්‍යප, අගස්ත්‍ය, පුලස්ත්‍ය, වාමදේව, අසිත, ගෞතම යනාදි බ්‍රහ්මඍෂි සමූහයක්[13] එක් කලෙක හිමාලයයේ දී ශක්‍රයා හමු වීමට ගොස් පවත්නා ගිලන් බව දක්වාලූ හ. එලෙස හිමාලයයට පැමිණි ඍෂිවරුනට ඉන්ද්‍රගේ අනුග්‍රහ ලැබුණි. එහි දී ඉන්ද්‍ර මෙය ආයුර්වේදය ඉගැන්වීමට හොඳ ම අවස්ථාව බව දක්වමින් ඔවුනට ආයුර්වේදය ඉගැන්වී ය. මෙහි පැමිණීම පිළිබඳ ව ඍෂිවරුනට ප්‍රශංසා කරන ඉන්ද්‍ර ඔවුනට ආයුර්වේදය පිළිබඳ ව උවදෙස් ලබා දෙයි. ඉන්ද්‍ර පවසන්නේ බ්‍රහ්මගෙන් ප්‍රජාපතීටත්, ප්‍රජාපතීගෙන් අශ්විනි කුමරුන්ටත්, අශ්විනි කුමරුගෙන් තමාටත් ආයුර්වේද ඥානය ලබා දී ඇති බවත් තමා ඒ ශ්‍රේෂ්ඨ ඥානය මහර්ෂීවරුනට ලබාදෙන බවත් ය. ඍෂිවරු ඉන්ද්‍රගේ මේ උවදෙස් පිළිගනිති. මෙහි භාරද්වාජගේ නම සඳහන් නො වීම විශේෂත්වයකි.

චරක සූත්‍රස්ථානය අනුව ඍෂි සම්මේලනයේ දී ඇති කරගත් අවසන් තීරණය අනුව ඉන්ද්‍ර වෙත ගොස් පවත්නා තත්ත්වය සමනය කර සෞඛ්‍යය සඳහා උවදෙස් ගත යුතු විය. ඒ අනුව සැමට වඩා තියුණු බුද්ධියෙන් ද තපසින් ද වෘද්ධ වූ භාරද්වාජ නම් ඍෂිවරයා ඉන්ද්‍ර වෙත ගොස් උවදෙස් ගත යුතු බවට ද තීරණය වෙයි. භාරද්වාජ එලෙසින් ඉන්ද්‍රගෙන් ආයුර්වේදය ඉගෙන යළි පැමිණ ඍෂිවරුනට ආයුර්වේදය ඉගැන්වීම් ප්‍රගුණ කළ බව එහි දැක්වෙයි.[14]

මේ අනුව සම්ප්‍රදාය සියල්ල ම පිළිගන්නා මතයක් ලෙස බ්‍රහ්මගෙන් වෛද්‍ය ඥානය ඇරැඹීම දැක්විය හැකි ය. එමෙන් ම බ්‍රහ්ම ස්වයංභූ ඥානයෙන් අවබෝධ කරගත් ආයුර්වේද ඥානය දක්ෂ ප්‍රජාපතීට ද දක්ෂගෙන් අශ්විනී කුමාරවරුනට ද ඒ දෙ දෙනාගෙන් ඉන්ද්‍රට ද ලැබුණු බවත් ඒ සියලු සම්ප්‍රදාය එක ලෙස පිළිගනී. ඒ පස් දෙනා ම දිව්‍යමය ආචාර්‍ය්‍යවරු වෙති. ඒ අනුව මිනිසුනට දෙවියන්ගෙන් ලැබුණ ශාස්ත්‍රයක් බව ද හැම සම්ප්‍රදායයක ම දැක්වේ.

උක්ත තොරතුරුවලට තරමක් වෙනස් වන තවත් ආයුර්වේදාවතරණ තොරතුරක් බ්‍රහ්මවෛවර්ත පුරාණයේ වෙයි. ඒ අනුව බ්‍රහ්මන් සිවු වේදය නිමවා පස් වැනි ව ආයුර්වේදය නම් පංචම වේදයක් මැවී ය. එය භාස්කරට ලබා දුනි. භාස්කර එය හදාරා දහසක් ශිෂ්‍යයනට ඉගැන්වී ය.[15]

භාස්කරගේ ශිෂ්‍යයන් ලෙස ධන්වන්තරී, දිවෝදාස, කාශිරාජ, අශ්විනි කුමාර, නකුල, සහදේව, යම, ච්‍යවන, ජනක, බුධ, ජාබාල, පෛල, කවඨ, අගස්ත්‍ය යන නම් ද ඒ ආචාර්යවරුන්ගේ කෘති ගැන ද දැක්වේ.

අගස්ත්‍ය සම්ප්‍රදායය නමින් ප්‍රචලිත ආයුර්වේද සම්ප්‍රදායයක් ද භාරතයේ පවතියි. සිද්ධ වෛද්‍ය සම්ප්‍රදායය යනුවෙන් ද මෙය හැඳින්වේ. මෙහි ආයුර්වේදාවතරණය සමස්තයෙන් ම වෙනස් ආරම්භයක් පෙන්වයි. එහි ආරම්භකයා ශිව දෙවියා යි. ශිවගෙන් පාර්වතීට ලැබෙන මේ ඥානය ඈ මුරුග නම් තම පුත්‍රයාට උගන්වයි. මුරුග අගස්ත්‍යට උගන්වන ශාස්ත්‍රය ඔහු තම ශිෂ්‍යයනට උගන්වයි. අගස්ත්‍ය හා ඔහුගේ 18ක් වූ ශිෂ්‍යයන් සිද්ධයන් ලෙසින් ප්‍රසිද්ධියට පත් ව මේ ශාස්ත්‍රය ඉදිරියට රැගෙනවිත් තිබේ. දහස් ගණන් ග්‍රන්ථ ද රචනා කර තිබේ.[16] ඔවුන්ගේ භාෂාව වූයේ දෙමළ භාෂාව යි.

අෂ්ටාංග සංග්‍රහයේ දී වාග්භට දක්වන්නේ ඍෂි සමූහයක් ශක්‍ර වෙත ගොස් ආයුර්වේදය හදාළ බව යි. ඒ අනුව පුනර්වසු, ධන්වන්තරී, භාරද්වාජ, නිමි, කාශ්‍යප, ලම්බායන නම් අචාර්‍ය්‍යවරු ඉන්ද්‍ර හමුවට ගිය බව දැක්වේ.[17]

සුප්‍රසිද්ධ බෞද්ධ ආචාර්‍ය්‍යවරයකු වූ නාගාර්ජුනපාදයන්ගෙන් රස වෛද්‍ය සම්ප්‍රදායය ආයුර්වේද ආචාර්‍ය්‍ය සම්ප්‍රදාය අතරට පසු කාලීන ව එක් වූවක් බව සැලැකේ. මේ ආචාර්ය සම්ප්‍රදායයේ දී රස දිය ප්‍රධාන කරගත් ධාතු වර්ග යොදාගනිමින් ප්‍රතිකාර කෙරේ. ආත්‍රේය ධන්වන්තරී සම්ප්‍රදායයේ ද ඖද්භිද පාර්ථිව, ජාන්තව වශයෙන් ඖෂධ තුන් වැදෑරුම් වුව ද බහුල වශයෙන් ම යොදාගනු ලැබ ඇත්තේ ඖද්භිදවලින් සිද්ධ කරන ලද ඖෂධ සංයෝග ය. රසදිය, ලෝහ,

තඹ, රන්, රිදී, ගන්ධක, හිරියල්, මනෝශීල ආදි ඖෂධ හා ගුණ ආමයික ප්‍රයෝග සම්බන්ධ සුළු විස්තර චරක හා සුශ්‍රුතයෙහි සඳහන් වුව ද ඒ ධාතු පදාර්ථවලින්, ජාරණ, මාරණ, ශෝධන, සත්වපාතන ආදි රස සංස්කරණ විධි ද සියලු ම රෝග සඳහා ව්‍යවහාරය ද ක්‍රමානුකූල ව දියුණුවට පත් කරන්නට නාගාර්ජුනපාදයෝ සමත් වූ හ.[18]

## නිගමනය

භාරතයේ පහළ වූ බොහෝ ශිල්ප ශාස්ත්‍රවලට වූවා සේ ම ආයුර්වේදයට ද සිදු වී ඇත්තේ දෛවාවතරණයක් ප්‍රබන්ධනය කිරීමකි. පැරණි භාරතීයයෝ නිසි ඇරැඹුමක් නො දුටු, එනම් ආරම්භයක් නො පෙනෙන තරම් පැරණි සියලු දේ දෙවියන්ගේ ලැබුණ බව විශ්වාස කළ හ. භාරතීයයන්ගේ විශ්වාසයක් අනුව කලාව පිළිබඳ පැරණිතම අංශයක් වන නාට්‍ය ශාස්ත්‍රය භරත මුනිවරයාට දෙවියන්ගෙන් ලැබුණකි.[19] වේද ග්‍රන්ථ දේවභාෂිතය ශ්‍රැති යනුවෙන් හැඳින්වෙන්නේ දෙවියන්ගෙන් ඇසූ යන අර්ථයෙනි. භගවත්ගීතාව කෘෂ්ණගේ උපදේශ සංග්‍රහයකි. මෙලෙසින් තත් කාලීන ජන විඥානය අනුව ආගමික ස්වරූපයකින් ඉදිරි පත් කිරීම එකල පැවැති සම්ප්‍රදායය යි. පොදු ජනතාව අතර වැඩි විශ්වාසයක් ගොඩනැගීමේ අරමුණ ඇති ව එලෙස සිදුකරන්නට ඇතැ යි සිතිය හැකි ය.

බුද්ධිය, දැනුම, මානසික දියුණුව උසස් තත්ත්වයක පැවැති පුද්ගලයන්ගෙන් ඇති වී පැවැත එන ශාස්ත්‍රාදිය එබඳු දැනුමක් නැති සාමාන්‍ය ජනයා අතරට යැවීමේ පහසු මඟ ඔවුන්ගේ විශ්වාසය මතින් එනම් දේව විශ්වාසය මතින් නැත හොත් ආගම හරහා ඔවුන් වෙත යැවීම යි. ආයුර්වේදයට ද දිව්‍යමය පසුබිමක් ගොඩනැගුණේ මේ අරමුණ අනුව බව විශ්වාස කළ හැකි ය. අනෙක් බොහෝ ශිල්ප ශාස්ත්‍රවලට සේ ම ආයුර්වේදයට ද වෘත්තාන්ත ස්වරූපයක් එක් වී තිබීම පිළිබඳ ව ද විචාරක අදහස් ඉදිරි පත් වී තිබේ.

මේ තොරතුරු සන්නිවේදය කිරීම සඳහා අද මෙන් එකල ප්‍රකාශන මාධ්‍ය රාශියක් නො තිබුණි. වඩාත් ප්‍රචලිත මාර්ගය වූයේ ගුරු මුඛයෙන් ශ්‍රවණය කිරීම යි. එබඳු ප්‍රකාශන ශ්‍රාවක සන්තානයට සුවසේ ගෝචර වීමට නම් ශ්‍රවණ රමණීය ශෛලියකින් ඉදිරි පත් විය යුතු ය. බොහෝ විට කරුණු ඒකාබද්ධ ව මතක තබාගැනීමට නම් හේතුඵල වශයෙන් සම්බන්ධ වූ සිද්ධිදාමයක් කථාන්තරයක ස්වරූපයෙන් ඉදිරි පත් විය යුතු ය. ඒ හේතුව නිසා ඉපැරණි ශාස්ත්‍රීය සිද්ධාන්ත පවා බොහෝ විට වෘත්තාන්ත ස්වරූපයෙන් ඉදිරි පත් වී තිබෙනු දැකගත හැකි ය.

## ආන්තික සටහන්

[1] කුමාරසිංහ, ඒ, 2007, 22 පිට

[2] ''සොහමායුර්වේදඃ ශාශ්වතෝ නිර්දිශ්‍යතේ අනාදිත්වාත් ස්වභාවසංසිද්ධලක්ෂණත්වාත් භාවස්වභාවනිත්‍යත්වාච්ච''(චරක.සූත්‍ර.30.27)

[3] ''තත්‍ර භිෂජා පෘෂ්ටේනෛවං චතුර්ණාමෘක්සාමයජුරථර්වවේදානාමාත්මනෝ අථර්වවේදේ
භක්ති රාදේශ්‍යා වේදෝ හ්‍යාථර්වණෝ දාන ස්වස්ත්‍යයන බලි මංගල හෝම නියම ප්‍රායශ්චිත්තෝපවාස මන්ත්‍රාදි පරිග්‍රහාච්චිකිත්සාං ප්‍රාහ'(චරක.සූත්‍ර.30.21)
ඉහඛල්වායුර්වේදෝ නාමෝපාංගමථර්වවේදස්‍යානුත්පාද්‍යෛවප්‍රජාඃ
ශ්ලෝකශත සහස්‍රමධ්‍යායසහස්‍රං ච කෘතවාන් ස්වයම්භූඃ
තතෝ'ල්පායුෂ්වමල්පමේධ සත්වං චාලෝක්‍ය නරාණාං
භූයෝ'ෂ්ටධා ප්‍රණීතවාන් (සුශ්‍රැත.සූත්‍ර.1.6)
අථර්වවේදේ භක්තිරදේශ්‍යා වේදෝ හ්‍යථර්වණෝ දානස්වස්ත්‍යයනබලි මංගල හෝම නියම ප්‍රායශ්චිත්තෝපවාස මන්ත්‍රාදිපරිග්‍රහාච්චිකිත්සාං ප්‍රාහ (චරක.සූත්‍ර.30.21)

[4] ඍග්වේදයජුර්වේදසාමවේදාථර්වවේදේභ්‍යඃ පඤ්චමෝ'යමායුර්වේදඃ'' (කාශ්‍යප විමානස්ථානය ශිෂෝපක්‍රමණීය 10))

[5] ''කෘත්වාතු පංචමං වේදං භාස්කරාය දදෞ විභුඃ'' (බ්‍රහ්මවෛවර්ත.16.20)

[6] වික්‍රමාරච්චි අභිනන්දන සංග්‍රහය, ජයසිංහ, 1968. 72 පිට

[7] බ්‍රහ්මණාහි යථාප්‍රෝක්තමායුර්වේදං ප්‍රජාපතිඃ
ජග්‍රාහ නිඛිලේනාදාවශ්විනෞ ත පුනස්තතඃ (4)
අශ්විභ්‍යාං භගවාඤ්ඡක්‍රඃ ප්‍රතිපේදේ හ කේවලම්
ඍෂිප්‍රෝක්තෝ භරද්වාජස්තස්මාච්ඡක්‍රමුපාගමත් (5) (චරක.සූත්‍ර.1.4-5)

[8] ''ශ්ලෝකශත සහස්‍රමධ්‍යාය සහස්‍රං ච කෘතවාන් ස්වයම්භූඃ
තතෝ'ල්පායුෂ්වමල්පමේධ සත්වං චාලෝක්‍ය නරාණාං භූයෝ'ෂ්ටධා ප්‍රණීතවාන්'' (සුශ්‍රැත.සූත්‍ර.1.6)

[9]''බ්‍රහ්මා ප්‍රෝවාච තතඃ ප්‍රජාපතිරධිජගේ තස්මාදශ්විනෞ
අශ්විභ්‍යාමින්ද්‍රඃ ඉන්ද්‍රාදහං මයා ප්‍රදෙයමර්ථිභ්‍යඃ ප්‍රජාහිතහේතෝඃ, භවතිචාත,
අහං හි ධන්වන්තරිරාදිදේවෝ ජරාරුජාතෘත්‍යුහරෝ
මරාණාම්''(සුශ්‍රැත.සූත්‍ර.1.20-21)
[10]කථං චෝත්පන්න ඉති ආහ- අථර්වවේදෝපනිෂත්සු ප්‍රාගුත්පන්නඃ
ස්වයම්භූර්බ්‍රහ්මා ප්‍රජාඃ සිසෘක්‍ෂුඃ ප්‍රජානාං
පරිපාලනාර්ථමායුර්වේදමේවාග්‍රේ'සෘජත් සර්විත් තතෝ විශ්වානි භූතානි
තතස්තං පුණ්‍යමායුර්වේදමනන්තමායුෂෝ
වර්ධනමාධාරමාප්‍යායනමමෘතමශ්විභ්‍යං කඃ ප්‍රදදෞ තාවින්ද්‍රාය ඉන්ද්‍ර
ඍෂිභ්‍යශ්චතුර්භ්‍යඃ කශ්‍යපවශිෂ්ඨාත්‍රිභෘගුභ්‍යඃ තේ පුත්‍රේභ්‍යඃ ශිෂ්‍යෝභ්‍යශ්ච
ප්‍රදදුර්හිතාර්තං ධර්මාර්ථකාමමෝක්‍ෂශක්තිපරිපාලනාර්ථං චේති ඒවමුත්පන්නඃ
(කා.ස.විමාන. ශිෂ්‍යෝ.10)
[11]විස්නමූතා යදාරෝගා ප්‍රාදුර්භූතාඃ ශරීරිණාම් තපෝපවාසාධ්‍යයන
බ්‍රහ්මචර්යව්‍රතායුෂාම්
තදා භූතේෂ්වනුක්‍රෝශං පුරස්කෘත්‍ය මහර්ෂයඃ
ෂමේතාඃ පුණ්‍යකර්මාණඃ පාර්ශ්වේ හිමවතඃ ශුභේ (චරක.සූත්‍ර.1.6)
[12] ''අංගිරෝ ජමදග්නිශ්ච වාසිෂ්ඨඃ කශ්‍යපෝ භෘගෘ''(චරක.සූත්‍ර.1.8-13)
[13]''ජග්මුර්භෘග්වංගිරා'ත්‍රිවසිෂ්ඨකශ්‍යපාගස්ත්‍යපුලස්ත්‍යවාමදේවාසිතගෞතමප්‍රභෘතයෝ
මහර්ෂයඃ'' (චරක.චිකිත්සා.4.3)
[14] අහමර්ථේ නියුජ්‍යෝයමත්‍රේති ප්‍රථමං වචඃ
භරද්වාජෝ'බ්‍රවීත්තස්මාදෘෂිභිඃ ස නියෝජිතඃ
සෝ'භිගම්‍ය ජයාශීර්භිරභිනන්ද්‍ය සුරේශ්වරම්
ප්‍රෝවාච විනයාද්ධීමානෘෂීණාං වාක්‍යමුත්තමම්
තස්මෛ ප්‍රෝවාච භගවානායුර්වේදං ශතක්‍රතුඃ
පදෛරල්පෛර්මතිං බුද්ධ්වා විපුලාං පරමර්ෂයේ (චරක.සූත්‍ර.1.19-21-23)
[15] ඍග්යජුඃසාමාථර්වබ්‍යාන්දෘෂ්ට්වා වේදාන්ප්‍රජාපතිඃවිචින්ත්‍ය තේෂාමර්ථං
චෛවා'යුර්වේදං චකාර සඃ
කෘත්වාතු පංචමං වේදං භාස්කරාය දදෞ විභුඃ
ස්වතන්ත්‍රසංහිතාං තස්මාද්භාස්කරශ්ච චකාර සඃ (බ්‍රහ්මවෛවර්ත.16.9-10)
[16] Agasthya (Wikipedia, 2008)
[17] ධර්මාර්ථ කාම මෝක්‍ෂාණාං විධ්නකාරීහිරාමයෙඃ
නරේෂු පීඩ්‍යමානේෂු පුරස්කෘත්‍ය පුනර්වසුම් 5
ධන්වන්තරි භරද්වාජනිමිකාශ්‍යප කශ්‍යපාඃ
මහර්ධයො මහාත්මානස්තථා ලම්බායනාදයඃ 6
ශතක්‍රතුමුපාජග්මුඃ ශරණ්‍යමමරේශ්වරම්
තාන්දෘෂ්ට්වෛව සහස්‍රාක්‍ෂා නිජගාද යථාගමම් 7(අෂ්ටාංග සංග්‍රහ.සූත්‍ර.1.5-6-7)
[18] වික්‍රමාරච්චි අභිනන්දන සංග්‍රහය, ජයසිංහ, 1968 75 පිට
[19] භරතමුනි ප්‍රණිහිත නාට්‍ය ශාස්ත්‍රය, 1පරි. 2 ශ්ලෝකය

## මූලාශ්‍රය නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

සුශ්‍රැත සංහිතා, ආර්. බුද්ධදාස අනුවාදය, රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව, කොළඹ, 1962

Nâtyasâtra, Edited by Manomohan, Calkutta, 1950.

Astângasangraha, Poone: Athreya, 1980.

Brahmavaiwvartha purâna.

Charaka Samhithâ, Danwanthari yantrâla. Sen, Kabiraj Debendra Nath Sen and Kabiraj Upendra Nath, 1974.

Kâsyapa Samhithâ, Vârânasi,India: Chaukhamba Visvabhârati, 1996.

Mahâbharatham. Geeta Press, Gorakhpur.

Sushruta Samhitâ, Vol ii. In *Nidâna-Sthâna, Sarira-Sthâna, Chikitsita-Sthâna,* 1911.

Sushruta Samhitâ, Vol-I Sutrasthânam. Kavirâj Kunja Lâl Bhishagratna, 1907.

Sushruta Samhitâ, vol-iii Uttharasthânam. Kavirâj Kunja Lal Bhishagratna, 1916.

### ද්විතීයික මූලාශ්‍රය

ගල්මන්ගොඩ, එස්. (2003) ආයුර්වේද අධ්‍යයනය හා ඉතිහාසය, **මූලධර්ම හා සමගාමී සංකල්ප.**

වික්‍රමාරච්චි අභිනන්දන සංග්‍රහය, ජයසිංහ, 1968.

මාරසිංහ, වෝල්ටර්. (පරි) (2004) **භරතමුනි ප්‍රණිහිත නාට්‍ය ශාස්ත්‍රය.** කොළඹ.

Winternitz, M. (1977) **A History of Indian Literature**. (2nd edition). University of Calcutta.

### අන්තර්ජාල මූලාශ්‍රය

*Agastya.* Retrieved feb 23, 2012, from Wikipedia.

*Brahma Vaivarta Purâna.*(2008). Retrieved Nov 04, 2010, from Wikipedia.